# GLOBAL ACADEMIC RESEARCH INSTITUTE

COLOMBO, SRI LANKA

## GARI International Journal of Multidisciplinary Research

ISSN 2659-2193

**Volume: 07 | Issue: 02**

On 30th June 2021

http://www.research.lk



Author: D.L.I.S. Ranchamara

University of Visual & Performing Arts, Sri Lanka



GARI Publisher | Performing Arts | Volume: 07 | Issue: 02

Article ID: IN/GARI/ICSD/2021/108 | Pages: 127-141 (15)

ISSN 2659-2193 | Edit: GARI Editorial Team

Received: 03.03.2021 | Publish: 30.06.2021

**පහතරට නර්තන නමස්කාරය සාම්ප්‍රදායික ගතික සංඡානනය ආශ්‍රයෙන් යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය.**

ඩී. එල්. අයි. එස්. රන්චාමර.

ප්‍රාසංගික කලාවේදී විශේෂ උපාධි, (සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය)

ජාතික ඩිප්ලෝමා රංගවින්‍යාසකරණය , (ජාතික පදනම් ආයතනය)

බලපත්‍රති ලුතිනන්, ශ්‍රී ලංකා ගුවන් හමුදාව,

බාහිර කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය.

inunilranchamara@gmail.com

(0094)071-2055887

**පර්යේෂණ ගැටලුව** - ආධුනික නර්තකයෙකුගේ අවධානයට, සංජානනයට, අවබෝධයට සහ ග්‍රහණයට හසු නොවන ආකාරයෙන් නමස්කාරය නම් වූ පළමුවන අභ්‍යාසකරණය ඉතා සංකීර්ණ වීමත්, විධිමත් ඉගෙනුම් ක්‍රියාවලියේ දී විකාශිත පහතරට නර්තන නමස්කාරය ශාස්ත්‍රීය නර්තනාංගයක් ලෙස පහතරට කිසිදු නර්තන ශෛලියක භාවිත නොවීම.

**උපන්‍යාසය** - නමස්කාර හරඹයන් දේශීය නර්තන විෂය ක්ෂේත්‍රයන්ට පසු කාලීනව අන්තර්ගත වූ නවාංගයක් විය හැකිය. විෂය නිර්දේශයානුකූලව විධිමත් අධ්‍යාපන ක්‍රමයක අවශ්‍යතාව මත පදනම් ව ගොඩනැගුණු නර්තන විෂයට ආධුනිකයා කායිකව, මානසිකව සහ සමාජීයව ප්‍රවිෂ්ට වීම සඳහා නමස්කාර හරඹය වැදගත්ය. නමුත් එම නවාංගය නර්තන විෂය නිර්දේශ සඳහා අන්තර්ගත කිරීමේ දී ශෛලියානුබද්ධව විකාශනය වී ඇති පහතරට නර්තනය ආශ්‍රයෙන් ආධුනිකයාගේ බුද්ධි මට්ටමට උචිත පරිදි පහතරට නර්තන නමස්කාර හරඹය සැකසීමේ දී එකී සංස්කාරක මණ්ඩලය උක්ත හරඹය පිළිබඳව අනවබෝධයෙන් සහ මනා ගවේෂණයකින් තොරව කටයුතු කරන්නට ඇත.

**හැඳින්වීම** - කලාව ආශ්‍රිත පර්යේෂණ ක්‍රියාවලියකදී, දැනුම නිවැරදි කිරීම සහ ස්ථිරකිරීම සඳහා සංකේත, සංකල්ප සහ තොරතුරු මනාව හසුරුවමින් එකී දැනුම න්‍යායාත්මකව ගොඩනැගීමට කලාවේ ප්‍රායෝගික භාවිතයන් උපකාරී වෙයි.[1] මෙම පර්යේෂණයේදී යථානුභූතීව නිදහස් මතය[2] ප්‍රකාශ කරන මුත් එහි වලංගුභාවය තහවුරු කිරීමට සෛද්ධාන්තිකව පරීක්ෂණයක් අවශ්‍ය බැවින් විද්‍යාත්මක පසුබිමකට අනුව කරුණු පිළිවෙළකට ගොඩනැගීමට අපේක්ෂිතය. මෙහි දී පහතරට

---

[1] පරමානන්ද හිමි, පොල්ගස්වත්තේ, පර්යේෂණ නිබන්ධන අත්පොත, සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2016, දෙවන මුද්‍රණය, 14 පිටුව.

[2] නිහාල් බර්ට්‍රම්, නිදහස් අදහස් නිදහස් ද?, ශාස්ත්‍ර බර්ට් පබ්ලිකේෂන්, ලක්මාලි මුද්‍රණාලය, නුගේගොඩ, 2014, ප්‍රථම මුද්‍රණය, 2, 3, 4, 5, පිටු

නර්තන නමස්කාරය පිළිබඳව වූ සංකල්පය නමස්කාර අර්ථ විවරණය, නමස්කාරයක අන්තර්ගත විය යුතු මූලිකාංග සහ පවතින නමස්කාර හරඹයෙහි දෝෂ පිළිබඳව වැඩි අවධානයක් යොමුකරන ලදි.

නමස්කාරය යන වචනාර්ථය විමසීමේ දී ආචාරකිරීම, නැමදීම, පිළිගැනීම, ගරු කිරීම, වන්දනය යනාදි අර්ථ ගැබ්ව පවතී. ශ්‍රී ලාංකේය ජනසමාජයෙහි නමස්කාරය යන වචනය ශ්‍රවණයේ දී ස්මෘතික වනුයේ බුදුදහමේ භාවිත නමස්කාරයයි. එකී නමස්කාර පාඨයෙහි මූල බීජය ආටානාට සූත්‍රයෙ හි මෙසේ දක්වයි. ''සාතාගිරි නමෝ යක්ඛෝ තස්සච අසුරින්ද දෝ භගවතෝ මහාරාජෝ සංතෝ අරහතෝ තථා සම්මා සම්බුද්ධස්ස මහා බ්‍රහ්මා එතේ පච්චපටිත්ථීතා'' සාතාගිරි යක්ෂයා ප්‍රථමයෙන් නමෝ ලෙසත්, රාහු, අසුරේන්ද්‍රයා විසින් තස්ස ලෙසත්, සතර වරම් දෙවියන් භගවතෝ ලෙසත්, සක් දෙවියන් අරහතෝ ලෙසත්, මහාබ්‍රහ්මයා විසින් සම්මා සම්බුද්ධ ලෙසත්, මෙකී පංච පිරිසකගේ ගෞරව පාඨයන්ගේ සම්මිශ්‍රණයෙන් වන්දනය උදෙසා නමස්කාර පාඨය නිර්මාණය වී ඇත. නමස්කාරය වනාහී ගෞරව කිරීම, වැඳීම, පිළිගැනීම යන අර්ථාන්විත මනෝමූලික ක්‍රියාවලිය සාක්ෂාත් කිරීමේ දී පුද්ගලානුබද්ධ මානසිකව, කායිකව සහ වාචිකව ක්‍රියාත්මක කෙරෙන ක්‍රියාවලිය ලෙස දැක්විය හැකිය.

නියොතිලක හෙවත් නව ශිලා අවධිය, කැල්තෝලිකය, මෙසොලිතිලකය ආදි අවධීන්හී දී නර්තනය මිනිසාගේ අධ්‍යාත්මය මුල් දෘෂ්‍ය හා අදෘෂ්‍යමාන බලවේග පිළිබඳව වූ ආකල්පය විස්තාරයෙහි ඵලයක් ලෙස නර්තනය දැක්විය හැකිය.[3]

ආධුනික නර්තකයෙකුගේ මනෝමූල ප්‍රකෘති කරමින් භාවමය, කායික අභ්‍යාසකරණයෙහි ප්‍රථම පියවර නමස්කාරය ලෙස දැක්විය හැකිය. ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් ආශ්‍රයව නර්තන නමස්කාරය, බෙර නමස්කාරය, නමස්කාර ගාථා, නමස්කාර ශ්ලෝක ආදි අංගයන් ශාන්තිකර්ම, වේදිකාව සහ නර්තන විෂය ඉගැන්වෙන ආයතනයන්හි ගායන, වාදන, නර්තන අංග ලෙස භාවිත කරයි.

රජයේ ලලිත කලා ආයතනයෙන් ආරම්භව විකාශනය වූ[4] සෞන්දර්ය කලාවිශ්වවිද්‍යාල විෂය නිර්දේශයන්හි සහ පාසැල් නර්තන විෂය නිර්දේශයනහි[5] අන්තර්ගත පහතරට නර්තන නමස්කාර හරඹයෙහි ප්‍රායෝගික සහ න්‍යායාත්මක දෝෂ ශිෂ්‍ය ප්‍රජාවගේ ප්‍රතිචාර සටහන් මගින් නිරීක්ෂණය විය. මාතර, බෙන්තර, රයිගම සහ සියනෑ කෝරළ ආදි වූ විවිධ අනු ශෛලින්ට අයත් ශාන්තිකර්මයන්හි භාවිත පොදු නමස්කාරය කුමක්ද? එවැනි නමස්කාරයක් සක්‍රීයව ශාස්ත්‍රීමය වශයෙන් භාවිතයෙහි තිබේද? ආදී කරුණු ගවේෂණය කිරීමෙන් නමස්කාරය යනු පාසැල් අධ්‍යාපන විෂයක් ලෙස නර්තන

---

[3] කැකුලන්ද කෝෂලී, ලක්දිව පැරණි නර්තන කලාව, සමන්ති පොත් ප්‍රකාශකයෝ, එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්, කොළඹ 10, 2014, ප්‍රථම මුද්‍රණය, 18, 19 පිටු.

[4] කාරියවසම් තිස්ස, ශ්‍රී ලාංකික නර්තනයේ විකාශනය,(1908-1978) සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2013, 171 පිටුව

[5] 1945 වර්ෂයෙන් පසුව පාසැල් විෂයක් වූ නර්තන විෂය 1972 නව විෂය නිර්දේශයට අනුව සෞන්දර්ය අධ්‍යාපනය අනිවාර්ය විෂයක් බවට පත් විය.

විෂය ඉගැනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රථම අභ්‍යාසකරණය ලෙසත් කලා මාධ්‍යක් වශයෙන් නර්තනය ඉගෙනීමට ගුරු ගෙදර අධ්‍යාපනය නැමති අවිධිමත් අධ්‍යාපන ක්‍රමයට පිවිසෙන ආධුනිකයන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියේ මුල් පියවර ලෙසත් නමස්කාර නර්තන අභ්‍යාසකරණය දැක්විය හැකිය. සාම්ප්‍රදායිකව ගුරු කුල ආශ්‍රයෙන් ලද පරිචය හා අධ්‍යාපන ක්‍රම මගින් අද්‍යතනය දක්වා විකාශිත පහතරට නර්තන නමස්කාරය සහ ඒ හා සබැඳි දෝෂ නිවැරදි කිරීමත්, එය සම්බන්ධව නවමු මතවාදයක් ඉදිරිපත්කිරීමත් මෙහි අභිප්‍රායෝ වෙත්. ක්ෂේත්‍ර ප්‍රජානන න්‍යායට අනුව අන්තර්ඥාන ප්‍රවේශයේදී සංජානනය ඉවහල් වෙයි. මෙම පර්යේෂණ ක්‍රියාවලියේ දී මා තත් විෂයෙහි සක්‍රීයව වසර විස්සකට අධික කාලයක් නර්තන ශිල්පියෙකු ලෙස ක්ෂේත්‍ර කටයුතු සඳහා සම්බන්ධ වීම මගින් ලද සංජානනීය අවබෝධය ඇසුරෙන් නර්තනය ඉගෙනීම සාර්ථක වීමෙහි ලා න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ආධුනික ප්‍රජාවගේ සමස්ත ග්‍රහණය කෙරෙහි නමස්කාර හරඹය යාවත්කාලීන කිරීමට මෙහි දී අපේක්ෂිත ය.

ගුරුකුල අධ්‍යාපන ක්‍රමයේදී නමස්කාර හරඹය ඉගැන්වීමේ දී ගුරුවරයා සවිඥ්ඤාණිකව වැදගත්කමක් ලබා දෙනුයේ සාම්ප්‍රදායික ශාස්ත්‍රීය අංගහාර සංජානනයේ පදනම නමස්කාරය වන බැවිනි. ගුරු කුළ අධ්‍යාපන ක්‍රමයෙහි ආධුනිකයාගේ මූලික ක්‍රියා පටිපාටිය යාග සාහිත්‍යයෙහි මෙලෙස දක්වා ඇත. [6]

අතින් මැන විග්ගුස්ස පා පරතරය සිහියට නගා සිටගෙන
නිතින් තුන්මුරු කරනවා ගෙන බිම ද දණ මණ්ඩියට සිටගෙන
බැතින් ගුරුවරු නැමද තා තෙයිතාම් තුන් වට්ටම් නටාගෙන
ඉතින් සරඹින් දොළොස් වට්ටම නටනු තාතෙයි තාම් දැනගෙන

එමෙන් ම පාරම්පරික ගුරුවරයා විසින් ඉගෙනුම් ක්‍රියාවලිය ප්‍රථිඵලදායක කරගැනීම සඳහා යථානුභූතීව

(i) කෙළින්සිට ගැනීම
(ii) මණ්ඩිය
(iii) අක්ෂිපතය
(iV) චලනය
(V) ලය හෙවත් තාලය

යන පංචවිධ අංගයන් සිංහල නැටුම් හි මූලික ලක්ෂණ ලෙස දක්වා ඇත. [7]

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙකී ලක්ෂණ ද ඇසුරෙන් පහතරට නර්තනයේ භාවිත නමස්කාරයෙහි අන්තර්ගත විය යුතු අනිවාර්ය මූලික ලක්ෂණ කිහිපයක් පිළිබඳව මෙම විස්තෘත පත්‍රිකාවෙන් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ අවධානය යොමු කරන්නට විය.

01. සරල බව සහ පහසුවෙන් නර්තනය කිරීමට හැකිවීම

---

[6] සේදරමන් ජේ. ඊ, උඩරට නැටුම් කලාව, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1979, 3 වනමුද්‍රණය, 154 පිටුව

[7] සේදරමන්, ජේ. ඊ, නෘත්‍ය චින්තාමනී, සී.ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, 1947, ප්‍රථම මුද්‍රණය, 21, 22 පිටු

02. සෑම ශෛලියකට ම පොදුවීම

03. වැදීමේ අංග චලනයක් වීම

04. අදාළ ශෛලීන්හි සුලභම දැකිය හැකිවීම

05. මූලික බෙර අක්ෂර ආශ්‍රයයෙන් බෙරපදය නිර්මාණය වීම

06. ලය මානය මත පිහිටා නර්තනය කිරීමේ හැකියාව

07. නිවැරදි සහ පිරිසිදු අංග චලනයන්ගෙන් යුක්ත වීම

01)සරල බව සහ පහසුවෙන් නර්තනය කිරීමට හැකිවීම

ගුරුකුල අධ්‍යාපනයේ දී වයස අවුරුදු හතෙහි පමණ සිට ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය මත පදනම් ව ගොඩනැගෙන නර්තන විෂය ධාරණය, අවශෝෂණය සහ අනුකරණය ආදි මූලිකාංගයන්හි මූලාරම්භය නමස්කාරයවන බැවින් එය ඉතා සරල විය යුතුය. මෙය විධිමත් අධ්‍යාපන ක්‍රමවේද යටතේ නර්තන විෂය ඉගෙනීමේ ක්‍රියාවලියට ද පොදු ය. මන්දයත් ශරීරය නර්තනය සඳහා අනුවර්තන කිරීමේ මූලික පියවර මෙයවන බැවිනි. මෙහි දී ඉගෙනුම පිළිබඳව තෝණ්ඩයික් ඉදිරිපත්කළ නීති තුනකි. එනම් අභ්‍යාස නීතිය, ප්‍රතිඵල නීතිය සහ සූදානම් නීතිය යි. මෙහිදී නමස්කාරය නම් ප්‍රබෝධකයට බන්ධනයවන ''ප්‍රතිචාරය නැවත නැවත සිදුකිරීමටත් අර්ථවත් හා තෘප්තිමත් ඉගෙනුමක් සඳහා ආධුනික මනසෙහිවන ව්‍යාකුලත්වයෙන් මිදී සූදානම් තත්වයෙන් යුක්ත ව අංගහාර සංජානනය කර ගැනීමට නමස්කාරය නම් වූ අභ්‍යාසය සරල විය යුතු ය. [8]

ජාතික අධ්‍යාපන ආයතනය මගින් සංස්කරණය කරන ලද 06 ශ්‍රේණිය නර්තන විෂය නිර්දේශයේ ද නර්තනය විෂය හා සම්බන්ධ විශ්වවිද්‍යාල සහ අනෙකුත් නර්තන අධ්‍යාපන ආයතනයන්හි ද පහතරට නර්තනය සඳහා ඉගැන්වෙන නමස්කාර හරඹය පහතින් දැක්වෙයි. [9]

''ගද්දිරිකිට ගුන්දිරිකිට ගත්තම් ගතම් දොං ගත් දැහිං'' ///

එය ඉතා සංකීර්ණ අංග චලනයන්ගෙන් යුත් පද කොටසක් බව දක්වමි. මෙම පද කොටස නිවැරදි අංගහාර සහිතව අත් කරකැවීම්, පාද හැසිරවීම් සහ ලය මානයන්ට අනුව අතිවිලම්භව ශරීරය හැසිරවීමට ආධුනිකයාට මනාපරිචයක් තිබිය යුතුය. නමුත් නර්තනයට ආධුනිකයෙකුට සහ පහතරට නර්තනයට ආධුනිකයෙකුට ඉහත දක්වන ලද සංකීර්ණ පද කොටස පූර්වාරම්භයේ දී නර්තනය කිරීම කෙතරම් ප්‍රායෝගික ද යන්න ගැටලුවකි. මෙම ඉගැනුම් ක්‍රියාවලියෙහි දී ආධුනිකයාගේ බුද්ධිමට්ටම්

---

[8] අබේපාල රෝලන්ඩ්, අධ්‍යාපනයේ මනෝ විද්‍යාත්මක පදනම, සාර ප්‍රකාශන, තරංගී ප්‍රින්ටර්ස්, නාවින්න, 2010, ප්‍රථම මුද්‍රණය, 168, 169, 170 පිටු

[9] 6 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය, සෞන්දර්ය දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම, ශ්‍රී ලංකාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2014, ප්‍රථම මුද්‍රණය, 13 පිටුව

වෙනස්වන බැවින් ධන උපස්ථම්භයක් ඔවුනට ලබා දීමටත්, ගුරුවරයා අපේක්ෂිත අභිලාෂ මට්ටමට ආධුනිකයා යොමුකිරීමට ත් නොහැකිවනු ඇත.

එකී පහතරට නර්තන විෂය නිර්දේශයන් හි අන්තර්ගත නමස්කාර හරඹය නර්තනය කිරීමට ආධුනිකයෙකුට ශක්‍යතාවක් තිබේ නම්, එම ආධුනිකයාට තත් විෂයෙහි අංගහාර ඉදිරිපත් කිරීමට හැකියාව ඇතිමුත් ගැටලුව වනුයේ ආධුනිකයෙකුගෙන් ප්‍රාරම්භක ක්‍රියාවලියේ දී එලෙස ශිල්පීය මට්ටමක් බලාපොරොත්තු වීමයි. නමුත් උඩරට, සබරගමු[10] සහ සෑම ඉන්දියානු නර්තන ශෛලියක්ම පාහේ නර්තනය කරනු ලබන නමස්කාරයන් නර්තනය කිරීමේදී සරල අංග චලන යුත්, විධික්‍රම භාවිත කරනු ලබන බව එකී නර්තන ශෛලීන් අධ්‍යයනය මගින් අවබෝධ විය.[11]

<u>02)සෑම ශෛලියකටම පොදුවීම</u>

නමස්කාර හරඹය වනා හි සෑම ශෛලියකට ම පොදු විය යුතුය. රයිගම, බෙන්තර, මාතර සහ සියනෑ කෝරළ රංග ශෛලීන් හි භාවිත නමස්කාර හරඹයන් පිළිබඳව අවධානය යොමු කිරීම වටී.
රයිගම නර්තන ශෛලියෙ හි නමස්කාර හරඹය ලෙස ඉතා සරල වූ සරඹ කොටසක් භාවිත කරයි.

රුඳ ගුඳ ගති ගතත් දොම් ගතම්[12] ///

බෙන්තර ශෛලියෙහි නමස්කාර පදය ලෙස[13]

අ) රෙගත ගත ගුං දැහිං.. ///

ආ) ගද්දිරිකිට ගුන්දිරිකිට ගත්තම් ගතම් ගත් දැහිං.. ///

ඇ) රුඳ ගුඳ ගද්දිරිකිට ගුංද ගත් දැහිං.. ///

මාතර ශෛලියෙ හි නමස්කාර පදය ලෙස[14]

අ) හුර ගත්තම් ගත ගුන්දත් දැහිං ///

ආ) තහුර දිහුර හුර ගත්තම් ගතත් දොම් ගත් දැහිං ///

ඇ) රුඳං ගුඳං ගත්තම් /// දොම් ගදිත ගතං

ලෙස විවිධ ගුරුකුල ආශ්‍රිතව සහ කාලානුරූපීව නමස්කාර හරඹය නර්තනය කිරීම වෙනස් වෙයි. සියනෑ කෝරළයෙ හි හෙවත් ගම්පහ ප්‍රදේශය පුරා ප්‍රචලිත පහතරට චූල නර්තන ශෛලියෙහි

---

10 රාජපක්ෂ ශ්‍රියාණි, සබරගමු නර්තන කලාව, සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2014, තෙවන මුද්‍රණය, 3 පිටුව

11 http://youtu.be/tiN6w0sQq-M

12 පහතරට රයිගම නර්තන ශෛලියෙ හි ප්‍රවීන නර්තන ශිල්පී, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ විශ්‍රාමික උපදේශක තඹවිටගේ රංජිත් රත්නසිරි මහතා සමග 2020.10.21 දින සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ දී කළ සම්මුඛ සාකච්ඡාව

13 පහතරට බෙන්තර නර්තන ශෛලියෙ හි ප්‍රවීන නර්තන ශිල්පී, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්ය හේමචන්ද්‍ර වීරසේකර මහතා සමග 2021.01.18 දින 395/14 පාසැල් මාවත, තන්තිරිමුල්ල, පානදුර එම මහතාගේ නිවසේ දී කළ සම්මුඛ සාකච්ඡාව ඇසුරෙනි

14 පහතරට මාතර නර්තන ශෛලියෙ හි ප්‍රවීන නර්තන ශිල්පී, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ බාහිර සහය වාදක රසික නවීන් මහතා සමග 2021.01.03 දින ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රාසංගික කලා අධ්‍යක්ෂකය, මූලික කඳවුර කටුනායක දී කළ සම්මුඛ සාකච්ඡාව ඇසුරෙනි

''ගද්දිරිකිට ගුන්දිරිකිට ගත්තම් ගතං දොම් ගතම්'' පදය නමස්කාර හරඹය ලෙස භාවිත කරයි.

පහතරට නමස්කාරය බෙර පද අතින් ගත් කල්හි විවිධය. නමුත් එකී හරඹය නර්තනය කිරීම සඳහා සරල වූ පොදු නර්තන විධි ක්‍රමයක් සෑම ශෛලියකම භාවිත කරයි. පහතරට නර්තන අංගහාරයන්ට උචිත පරිදි වම් අත පපුවට ඉදිරියෙන් සමාන්තරව තබා ආරම්භකරනු ලබන හරඹය දක්ෂිණාවර්ථව කැරකී වැඳීමත්, ඒ ආකාරයටම වමට, දකුණට තෙවරක් නර්තනය කිරීමත්, සෑම ශෛලියක ම නමස්කාරය නර්තනය කිරීමට පොදු ක්‍රමයක් ලෙස අනුගමනය කරයි.

රයිගම, බෙන්තර, මාතර සහ සියනෑ කෝරළ නර්තන ශෛලීන්හි සම්ප්‍රදායිකව නර්තන කරන, ඉගැන්වෙන, නර්තන නමස්කාර හරඹය නර්තනයට පොදු, සරලව ක්‍රමයක් භාවිත කරන බව තහවුරු විය. එමෙන්ම දාර්ශනික පසුබිමක් සහ අවබෝධයකින් යුතු ව විෂය නිර්දේශයන් හි අන්තර්ගත නමස්කාර හරඹය සැකසූවා නම් එය සම්ප්‍රදාය නොනසා නූතන අවධියට ද යෝග්‍යවන සෙ 'නව මුහුණුවරකින් තාණ්ඩව සහ ලාස්‍ය ලක්ෂණයන්ට අතර මැදි ලක්ෂණයන්ගෙන් යුක්තව නර්තනය කළ හැකි ය.[15]

03) <u>වැඳීමේ අංග චලනයන්ගෙන් යුක්ත වීම.</u>

නමස්කාර යන වචනාර්ථයෙහි වැඳීම, ගරු කිරීම, ආචාර කිරීම යනාර්ථ ගැබ්ව පවතී. පුද්ගලයෙකුගේ රට, ජාතිය, ආගම යන සංස්කෘතික ලක්ෂණ අනුව නමස්කාරය හෙවත් වැඳීමේ ක්‍රම විවිධාකාර වුවද එයින් සිදුවන මනෝමූලික ක්‍රියාවලිය එකකි. බෙර වාදනයේ දී කඩිප්පුව අතැතිව හෝ දෑතින් බෙර නමස්කාරය කරනු ලබන අතර නමස්කාර ගාථා, කවි, ශ්ලෝක මඟින් බුදුන්, දෙවියන්ගෙන්, ගුරුන්ගෙන්, දෙමව්පියන් ගෙන් සහ සභාවෙන් අවසර ගැනීමක් සිදුවෙයි. උඩරට නර්තන සම්ප්‍රදායෙහි නමස්කාරය සහ අර්ථය මෙලෙස දක්වනුයේ ඉහත කියමන සාක්ෂාත් කිරීමේ අරමුණෙනි.

| **<u>නමස්කාරය</u>** | | **<u>අර්ථය</u>** |
|---|---|---|
| තෙයියත් /// තාම් | - | මිහිකත මත රැගුම් පෑමට මාගේ හෘද සාක්ෂියට එකඟව බුදුන් නමස්කාර කරමි. |
| තෙයියත් /// තාම් | - | මිහිකත මත රැගුම් පෑමට මාගේ හෘදසාක්ෂියට එකඟව දෙවියන් නමස්කාර කරමි. |
| තෙයියත් /// තාම් | - | මිහිකත මත රැගුම් පෑමට මාගේ හෘදසාක්ෂියට එකඟව ගුරු දෙමාපියන් නමස්කාර කරමි. |

උඩරට නමස්කාරයේ භාවිත දෑතින්ම වැඳීමේ මුද්‍රාව භරත නාට්‍යම්හී දී අංජලි නැමති සම්යුත හස්ත මුද්‍රාව ලෙස භාවිත කරයි. මෙම මුද්‍රාව අනෙකුත් ඉන්දීය නර්තන ශෛලීන්හි විවිධ නාමයන්ගෙන්

[15] නර්තන කලාවේ දාර්ශනික මුහුණුවර, කේ. බී. ඒ. එඩ්මන්ඩ් සංඛ, ජූලි - දෙසැම්බර් කලාපය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 2004, 39 පිටුව

භාවිත කරන අතර බුදු පිළිමයන්හි හස්ත මුද්‍රා[16] නිරීක්ෂණයේදී එකී මුද්‍රාවම ''අංජලී කරණීය මුද්‍රාව'' නමින් ද හඳුන්වයි.[17]

මෙහිදී නමස්කාරය නර්තනය් දී බුදුන්, දෙවියන්, ගුරුවරුන් සහ සබයෙන් අවසර ගැනීමේ දී භක්ති රසය මූලිකව ආධුනිකයාගේ භාවමය, මනෝ සහ ආංගික ස්ථායී භාව උද්දීපනය වීම නිසා හට ගන්නා රස හා භාව පූජාර්ථය ප්‍රථුල කරයි.[18] මෙම පර්යේෂණ විස්තෘත පත්‍රිකාවෙහි මින් ඉදිරියට පෙර දක්වන ලද විෂය නිර්දේශයන් හි අන්තර්ගත නමස්කාරය දෝෂ සහිත නමස්කාරය දෝ.ස.න ලෙස දැක්වෙයි. එමෙන්ම විෂය නිර්දේශය සඳහා අන්තර්ගත කිරීමට අපේක්ෂිත රයිගම් කෝරළ ශෛලියෙහි විකාශිත ""රුඳ ගුඳ ගති ගතත් දොම් ගතම් " යන යෝජිත නමස්කාර හරඹය යෝ.න.හ ලෙස දැක්වෙයි. දෝ.ස.න.හ නර්තනය මගින් නමස්කාරාත්මක චලනයක් ප්‍රතීයමාන නොවන මුත් යෝ.න.හ. මගින් ආධුනිකයාගේ දෘෂ්ඨී පථයට හසුවන සැම දෙනෙකුටම නමස්කාරාත්මක චලනයක් බැව් සම්ප්‍රේෂණය කරයි.

04) <u>අදාළ ශෛලීන් හි සුලභ ව දැකිය හැකිවීම</u>

පහතරට නර්තනය විකාශිත ශෛලීන්හි දේව, යක්ෂ, ග්‍රහ පිදීමේ අභිචාරයන්හි භාවිත නමස්කාර හරඹය ලෙස පෙර කී රුඳ ගුඳ ගතිගත් ගතත් දොම් ගතත් හරඹය දැක්විය හැකිය. මෙකී ශෛලීන්හි මල්අස්න නැටීම, ශුද්ධමාත්‍ර නැටීම, ලිච්ඡවි, තෙල්මෙ, යහන්දැක්ම, පන්දම් ආදී නර්තනයන් ආරම්භයේදී හෝ අවසානයේදී උක්ත නමස්කාරය නර්තනය කරනු ලබයි.

පාසල්විෂය නිර්දේශයන්හි අන්තර්ගත  දෝ.ස.න.හ බෙර පදය රයිගම නර්තන ශෛලියෙහි යහන්දැක්ම අවසානයේ නර්තනය කරනු ලබන ''වැඳුම්අත'' නම් වූ පදකොටසෙ හි අනු කොටසක් ම පමණක් බව "13 ශ්‍රේණියේ නර්තන ගුරු මාර්ගෝපදේශනය" කෘතියෙ හි සහ "13 ශ්‍රේණිය නර්තන අතිරේක කියවීම්" කෘතියෙහි ද දක්වා ඇත. [19]යහන් වෙතට දෙවියන් වැඩම වීමෙන් අනතුරුව නර්තනය කරන යහන්දැක්ම නර්තනාංගයෙහි දෑතෙහි චලනයන්ට මූලික ස්ථානයක් දෙමින් නර්තනය කරනු ලබන වැඳුම්අත නම් වූ පද කොටස මෙසේ දැක්වෙයි.

රුඳං ගත්ත ගතං ගත්ත ගුඳං ගත්ත ගතත් දොම් //
රුඳං ගත්ත ගතත් දොම්
ගුඳං ගත්ත ගතත් දොම්

---

16 https: // images. app. goo. gl / 8 KD4Z 5m 5y qkha JTET.

17 https: // s I m Wikipedia. Org / wiki

18 පතිරණ සේනාරත්න, නන්දි කේෂ්වරයන්ගේ අභිනය දර්පණය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 1991, ප්‍රථම මුද්‍රණය, 28 පිටුව

19 නර්තනය, අතිරේක කියවීම් පොත, 13 ශ්‍රේණිය, සෞන්දර්ය දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම, ශ්‍රී ලංකාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2014, ප්‍රථම මුද්‍රණය, 26/27 පිටු

ගතත් දොම්

ගුදත් දොම්

ගද්දිරිකිට ගුංදිරිකිට ගත්තත් ගතත් දොම් ///

මෙයින් පසක් වනුයේ දෝ.ස.න.හ යහන්දැක්මෙහි නර්තනය කරනු ලබන වැඳුම් අත නම් වූ කොටසට අයත් පද කොටසක් ලෙස විෂය නිර්දේශ සඳහා අන්තර්ගත කර ඇති බවක් ය. පහතරට නර්තනය විකාශිත සෑම නර්තන ශෛලියකම යෝ.න.හ ත්‍රිවිධරත්නය, දෙවියන්, ගුරු දෙමාපියන් සහ සබයෙන් අවසර ගැනීමට ශාන්තිකර්මවල විවිධ ලය මාන අනුව සරලව නර්තනය කරයි. නමුත් පාසල්විෂය නිර්දේෂයන්හි සහ විශ්වවිද්‍යාල ඇතුලු අනෙකුත් අධ්‍යාපන ආයතනයන්හි ඉගැන්වෙන දෝ.ෂ.න.හ අවසර ගැනිමට හෝ වෙනත් පරමාර්ථයින් යුතුව කිසිඳු ශාන්තිකර්ම අවස්ථාවක නර්තනය නොකරන බැව් අවධාරණය කරමි.

05) <u>මූලික බෙර අක්ෂර ආශ්‍රයෙන් බෙර පදය නිර්මාණය වීම</u>

නමස්කාරය නර්තනය කිරීම සඳහා බෙර වාදනය සිදු නොකරන බැව් විෂය නිර්දේෂයන්හි දක්වා තිබුන ද එය දේශීය නර්තන සම්ප්‍රදායන්වන උඩරට සහ සබරගමු සම්ප්‍රදායන්ට පමණක් නිරවද්‍ය ප්‍රකාශයකි. මන්දයත් ආධුනිකයා නමස්කාර හරඹය ග්‍රහණය කරගත් පසු පහතරට නර්තන සම්ප්‍රදායෙහි නමස්කාරය සඳහා පහතරට බෙරය වාදනය කරයි. විෂය නිර්දේෂයන්හි භාවිත දෝ.ස.න.හ. පදය පහත දැක්වෙන ආකාරයට වාදනය කරයි.

ගත් දිරිකිට ගුන් දිරිකිට ගත්තම් ගතම් දොම් ගත් දැහිං

ගඳිරි ගුඳිරි

මෙහි දි දිරිකිට යන අක්ෂරය වාදනය වනුයේ දිතගත/ කිටිතක/ කිටිගත යනුවෙනි. එම අක්ෂර කඩිනම් ලයට වාදනය වීමේ දී ඉහත දැක්වූ ආකාරයට ගඳිරි, ගුඳිරි ලෙස වාදනය වෙයි. නමස්කාරය වැනි මූලික සහ පූර්ව සරඹයක් වාදනයේ දී සරල සහ මූලික බෙරපදවන ගුම්, ගත්, දි, ත යන තීව්‍ර ධ්වනි ගුණයක් සහිත බෙර අක්ෂර[20] වාදනය උචිත බැව් අවධාරණය කරන අතර බර, හරඹ, කඩිනම් ලය මානයන් ට උක්ත පද කොටස් වාදනයේ දී මූලික අක්ෂර ගති ලක්ෂණ ඉස්මතු වන පරිදි වාදනය කිරීමෙන් එකී සෑම ලය මානයකට ම අලංකාර පද වාදනය නොකොට මූලික බෙරපද පමණක් වාදනය කිරීම වැදගත් බව අවධාරණය කරමි.

එම නිසා යෝ.න.හ වාදනයේ දී වම දකුණ සමබරව වාදනයවන පද කොටසක් බව දක්වමි. ''රුඳ''යන අක්ෂරය පහතරට බෙර වාදනයෙහි ප්‍රථම බෙර හරඹයවන''කඩ ගුම්'' හරඹයෙ හි ද්විතීයික අවස්ථාව බවත් ''රුඳ'' යන පදය වාදනයේ දී වාදන ශිල්පීන් අවස්ථානුකූලව ගුඳ ලෙස වාදනය කරන බව දක්වමි. එම නිසා ඉතා සරළවූ ත්, නිවැරදිවූ ත්, නමස්කාර පදය ලෙස යෝ.න.හ දක්වමි.

[20] පහතරට බෙර වාදනයේ දී නිවැරදි හඬ නිෂ්පත්තිය කිරීමට අසීරු අක්ෂර මෙම අක්ෂර නිසාත්, සෑම බෙර පදයක් ම පාහේ මෙම අක්ෂර ඇසුරෙන් නිර්මාණය වී ඇති නිසාත්, මෙම අක්ෂර පහතරට බෙර වාදනයේ බීජාක්ෂර බැව් මාගේ අදහස යි.

| | | | | |
|---|---|---|---|---|
| ය/ ගු ඳ ගු ඳ | ග ති | ග තම් | දොම් | ග තම් |
| ද ව ද ව | ද ව | ද ව | (ද + ව) | ද ව |

06) <u>ලය මාන මත පිහිටා නර්තනය කළ හැකි වීම.</u>

පාසැල් විෂය නිර්දේෂයන් හි අන්තර්ගත දෝ.ස.න.හ නර්තනය අති විලම්භ ලය මත පිහිටා නර්තනය කිරීම ආධුනිකයෙකුට සංකීර්ණ වූ ක්‍රියාවලියකි. පෙර දක්වන ලද දෝ.ශ.න.හ නර්තනය කරනු ලබන පදය සහ දිශාවන් පහත දැක්වෙයි.

| ගද්දිරිකිට | ගුන්දිරිකිට | ගත්තම් | ගතත් දොම් ගත් දැහිං |
|---|---|---|---|
| ඉදිරියට | පිටුපස | පිටුපසට | ඉදිරියට |

මෙහිදී ආරම්භක ඉරියව්වේ සිට වාමාවර්ථව කැරකී නර්තනය කරනු ලබන අතර දෝ.ස.න.හ බර (විලම්භ) ලයට නර්තනය කිරීමට හැකියාව ඇති මුත් හරඹ ලයට (මධ්‍ය) නර්තනය කිරීම අසීරු බවත්, කඩිනම් ලයට (ධෘත) නර්තනය කිරීම ඉතා අසීරු කාර්යයක් බවත් දක්වමි. නමුත් බර, හරඹ, කඩිනම් යන ලය මානයන්ට අනුව නර්තනය කිරීමට සරල වූ ක්‍රමවේදයක් යෝ.න.හ. යෙහි භාවිත කරයි. ඉතා සරලව සංකීර්ණ අත්කරකැවීම් නොමැතිව, අඩි පහක් සෑම අවස්ථාවකදී ම ඉදිරියට තබා හුරට (දක්ෂිණාවර්ථව) සහ නුහුරට (වාමාවර්ථව) කැරකෙමින් සෑම ලය මානයකටම එකසේ නර්තනය කළ හැකි හරඹ කොටසක් බවට යෝ.න.හ යෝජනා කරමි.

07) <u>නිවැරදි සහ පිරිසිදු අංග චලනයන්ගෙන් යුක්ත වීම</u>

ආධුනිකයාට විෂයෙහි ආකෘතිය ධාරණය වීම සඳහා (retention phase) නිරීක්ෂණ ආකෘතියක් සංවිධානාත්මකව නිවැරදිව සහ ශුද්ධ වූ අංගහාර සහිතව ඉදිරිපත් කිරීමේ දී මුද්‍රා භාවිතය ඉතා වැදගත් ය.[21] මෙහි දී නර්තනයේ දී භාවිත කරනු ලබන මුද්‍රා පිළිබඳ අවබෝධය ඉතා වැදගත් ය. පහතරට නර්තනය වනාහි අභිචාර ආශ්‍රිතව ආතුරයා ට (ප්‍රේක්ෂකයාට) සෙත්කිරීමේ අභිප්‍රායෙන් විකාශනයවූ සම්ප්‍රදායකි. බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රය සංකේතාත්මකව නිරූපණයවන පරිදි මැදැඟිල්ල, වෙදැඟිල්ල, සුළැඟිල්ල දිගු කිරීමෙන් එකී රත්නත්‍රයෙහි, ආනුභාවයත් මහපටැඟිල්ලෙහි සහ දබරගිල්ලෙ හි ඇඟිලි තුඩු ඇල්ලීමෙන් එම ශක්තිය හරහා සෙත සැලසීම, ආවැඩීම නිරූපණය වෙයි. මෙකීමුද්‍රාව[22] විතර්ක මුද්‍රාව[23] ව්‍යාඛ්‍යාත මුද්‍රාව (බුද්ධ ප්‍රතිමා හස්ත)යෝග ව්‍යායාම්හී දී භාවිත කරන

[21] මුද්‍රා යෙදුම පිළිබඳ අර්ථකතනයක්, ඩබ්. එච්. ගුණතිලක, නර්තන ගවේෂී, සංස්කෘතික මහාචාර්ය ලයනල් බෙන්තරගේ, සේනාරත්නපතිරණ, 2016, 70, 71, 72 පිටු

[22] l http:// pin.it/35 wgkoy

[23] http://www.google.com/imgres? imgurl= httÑ/ 3A% 2F% fupload wiki media. org% 2F wikipedia

(මිනිස් සිරුරේ නිල මණ්ඩල පවිත්‍රකාරක මුද්‍රාවන අධිශක්තිමුද්‍රාව, මූලධාරමුද්‍රාව, අනහත මුද්‍රාව)[24] මුද්‍රාඛ්‍ය (කථකලී)[25] හම්සාස්‍යය[26] (භරත නාට්‍යම් අසම්යුත හස්ත) ඥාණමුද්‍රාව[27] (යෝග හස්ත මුද්‍රාව) ආදී මුද්‍රාවන් ට සාම්‍ය වේ. පහතරට නර්තනයේ දී අත්කැරකැවීම සඳහා පෙර මුද්‍රාවම පමණක් උපයෝගී කරගත නොහැකි බැවින් ඇඟිලි විහිදුවා කරකැවීමක් සිදුකරයි. මෙම ඇඟිලි විහිදුවීමේ මුද්‍රාව අවහිතස්තෙව (භරත නාට්‍යම් සම්යුත මුද්‍රා) ආලපද්ම[28] (භරත නාට්‍යම් අසම්යුත මුද්‍රා) ආදි මුද්‍රා පහතරට නර්තනයේ දී මුද්‍රා ලෙස භාවිත කරයි. එක් අතක් පපුවමැද්දට සමාන්තර වන ලෙසත්, අනෙක් අත කනට සමාන්තරව වැලමිට පහළට සිටින සේ තබා ගැනීම පහතරට නර්තනයේ හස්ත අංගහාරයෙහි අනන්‍යතාවයයි. මෙවැනි මුද්‍රා භාවිතය මගින් ආධුනිකයාගේ මොළයේ ක්‍රියාකාරීත්වය සහ මතක ශක්තිය වර්ධනය ද බලපෑම් සිදුකරයි.

නමුත් දෝ.ස.න.හ නර්තනයේ දී ''ගත් '' අක්ෂරය නර්තනය සඳහා භාවිත කරන ඉරියව්ව භරත නාට්‍යම් හි ආලපද්ම මුද්‍රාවට සමාන වුව ද එය පහතරට නර්තනය හා සමගාමී ශෛලීන්හි මූලිකව භාවිතවන හස්ත මුද්‍රාවක් නොවන බව අවධාරණය කරමි. එම ඉරියව්ව පහත රූපයෙන් දැක්වේ.



නමුත් යෝ.න.හ. නර්තනයේ දී පහතරට ගති ලක්ෂණය අනුව සරල මූලික අංගහාරය නොවෙනස්ව ඉදිරියට අඩි පහක් තබා දක්ෂිණාවර්ථව (හුරට) කැරකී (ඒකපාදභ්‍රමරි)[29] වැදීමක් සිදුකරයි. නමුත් දෝ.න.හ නර්තනයේදී නිරීක්ෂණය වූ දෝෂයක් ලෙස පළමු අවස්ථාවේදී වාමාවර්ථව (නුහුරට) කැරකීමක් සිදුවෙයි. නමුත් පහතරට නර්තන අංගහාර සහ නිවැරදි ශිල්ප ක්‍රම මත පිහිටා හුර සහ නුහුර සමබර වන පරිදි සරල, පිරිසිදු, නිවැරදි අංග චලන යෝ.න.හ භාවිත කරයි.

---

[24] http://www.dreamstime.com / chakras – muduras mantras – table – meaning –colours – symbols – singns – gestures – image – position – hands – matching – detailed

[25] http:// pin.it/S4D klms

[26] http:// images. app. google/SCMgwlvBCASTuZhM7

[27] මුද්‍රා යෙදුම පිළිබඳ අර්ථකතනයක්, ඩබ්. එච්. ගුණතිලක, නර්තන ගවේෂී, සංස්කෘතික මහාචාර්ය ලයනල් බෙන්තරගේ, සේනාරත්නපතිරණ, 2016, 77 පිටු

[28] http:// pin.it / S4Dk/ms.

[29] පතිරණ සේනාරත්න, නන්දි කේෂ්වරයන්ගේ අභිනය දර්පණය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 1991, ප්‍රථම මුද්‍රණය, 72 පිටුව

**සාකච්ඡාව**

ආධුනිකයා පූර්ව කාලීනව නිරීක්ෂණයෙන් මෙන්ම අනුකරණාත්මකව ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාක්ෂාත්කර ගැනීමට ප්‍රයත්න දරයි. සමාජ ඉගෙනුම් න්‍යායට අනුව ගුරුවරයා යනු ඉගෙනුම් ආකෘතියකි.[30] එමනිසා ගුරුවරයා සම්ප්‍රේෂණය කරනු ලබන ඥාණය මීමංසාත්මකව ඉදිරිපත් කළ යුතුය. නමස්කාරය නම් වූ ආරම්භක අභ්‍යාසකරණය පිළිබඳව අවතක්සේරුවෙන් නොව ඒ පිළිබඳ අවබෝධය සහ අවදානය යොමු කිරීම ඉතා වැදගත් ය. නර්තන අධ්‍යාපනයේදී විෂය නිර්දේෂයන්හි භාවිත දේශීය නර්තනය හා බැඳි නමස්කාරයන් හි ප්‍රභවය පිළිබඳ කරුණු විමසීමේ දී

දැනට නර්තන ක්ෂේත්‍රයෙ හි කටයුතු කරනු ලබන පරිණත ශිල්පීන් සමග කළ සම්මුඛ සාකච්ඡා මගින් තහවුරු වූයේ ඔවුන් ආධුනික අවධියෙ හි නර්තනය ඉගෙනීමේ දී ආධ්‍යාත්මික සහ සදාචාරාත්මක ගුණ වගාවක් උදෙසා ගුරු, දෙමව්පියන් සහ භූමියට වන්දනය සඳහා දෑතේ ඇඟිලි එක්කොට වැඳීමේ චලනයක් භාවිත කළ ද එය නමස්කාරය ලෙස හැඳින්නොවූ බවයි. දේශීය නර්තන සම්ප්‍රදායන් හි ඉගැන්වෙන නමස්කාර හරඹයන් පසුකාලීනව එකී සම්ප්‍රදායන් ට අන්තර්ගත වී විකාශනය වීමේ දී ඉගැන්වීමේ පහසුව තකා ඉන්දියානු නර්තන අභාසයෙන් යොදා ගත්තා ද ? යන්න පිළිබද ව ප්‍රශ්නාර්ථයකි.[31] මන්දයත්, රබීන්ද්‍රනාත් තාගෝර් තුමා ඇතුළු ශාප් මෝෂන් (ශාපයෙන් මිදීම) නාට්‍ය කණ්ඩායමෙහි ශ්‍රී ලංකා සංචාරයෙන් පසුව පුනරුද ශ්‍රී ලාංකේය නර්තන කලාවෙහි නියැළුණු ශිල්පීන් ඉන්දියානු ශිෂ්‍යත්ව ලබා ඉන්දීය නර්තන ශෛලීන් එම රටෙහි හදාරන්නට අවස්ථාව උදාකරගන්නට විය.[32] එකී අධ්‍යන කටයුතු නිම කිරීමෙන් අනතුරුව ඔවුන් නැවත මව් රටට පැමිණීමත්, සමඟ මවුන් විසින් දේශීය නර්තනයේ ද විවිධ විපර්යාසයන් ඇතිකරන්නට විය.[33] විශේෂයෙන්ම රජයේ ලලිත කලායතනයේ ආදී කතෘවරුන් ලෙස සේවය කළ පණීභාරත, චිත්‍රසේන, ප්‍රේම කුමාර එපිටවෙල, වසන්ත කුමාර ආදී විෂය ප්‍රවීණයෝ පාසැල් විෂය නිර්දේශ සහ විශ්වවිද්‍යාල විෂය නිර්දේෂ සකස් කිරීමේ කාර්‍යයට දායක වූහ. දේශීය සම්ප්‍රදායන්ගෙන් ආභාෂය ලබා නවාංගයක් ලෙස විධිමත් අධ්‍යාපන ක්‍රමයකට අවශ්‍යය පදනමක් සහ අවතීර්ණයක් ලබා දීමේ අරමුණෙන් නර්තන නමස්කාරය දේශීය නර්තන විෂය ක්ෂේත්‍රයට එක් වූවා ද? යන්න මෙම හේතු සාධක මත පිහිටා උපකල්පනය කළ හැකිය. ඓතිහාසිකව නර්තන නමස්කාරය භාවිතය පිළිබඳව ප්‍රාථමික හෝ ද්වීතියික මූලාශ්‍රයක සදහන්ව නැත. පසු කාලීනව නර්තන විෂය විධිමත්ව ඉගැන්වීම සඳහා සදාචාරාත්මක ගුණ වගාව, ආධ්‍යාත්මික ආශිර්වාදය, ධනාත්මක ආකල්ප වර්ධනය ආදී උසස් හර පද්ධතියක ට බලපාන ගුණාංග

---

30 අබේපාල රෝලන්ඩ් , අධ්‍යාපනයේ මනෝ විද්‍යාත්මක පදනම, සාරප්‍රකාශන, 2010, 203 පිටුව

31 නර්තන කලාවේ දාර්ශනික මුහුණුවර, කේ. බී. ඩී. එඩිමන්ඩ්සංබ, ජූලි - දෙසැම්බර් ශාස්ත්‍රිය ලිපි සරණිය, සංස්කෘතිකකටයුතු දෙපාර්තමේන්තුව, 2004, 38 පිටුව

32 කාරියවසම් තිස්ස, ශ්‍රී ලාංකේය නර්තනයේ විකාශනය, සී.ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2013, 42, 43 පිටු

33 අජන්තා ආරියවතී, නර්තන විකාශනය, තරංජී ප්‍රින්ටස්, මහරගම, 187 පිටුව

වර්ධනය උදෙසා ත්, නිශ්චිත ක්‍රම වේදයකට,රාමුවකට නර්තන විෂය සැකසිය යුතු නිසා ත්, නර්තන නමස්කාරය පාසැල් සහ අනෙකුත් අධ්‍යාපන ආයතනයන් හි විෂය නිර්දේශ සඳහා නමස්කාර හරඹය අන්තර්ගත කරන්නට ඇත. එකී උපකල්පනය තහවුරු වනුයේ උඩරට නර්තනයේ කෝෂ්ඨාගාරය ලෙස හඳුන්වන කොහොඹා යක් කංකාරිය ශාන්තිකර්මයෙහි කිසිඳු අවස්ථාවක විධිමත් අධ්‍යාපන ක්‍රමය යටතේ උඩරට නර්තනයේ දී භාවිත නමස්කාර හරඹය භාවිත නොවන බැවිනි.එමෙන් ම සබරගමු නර්තන සම්ප්‍රදායානුකූලව පාසැල් සහ අනෙකුත් අධ්‍යාපන ආයතනයන්හි ඉගැන්වෙන නමස්කාර හරඹය කිසිඳු සබරගමු ශාන්තිකර්මයක හෝ ශාස්ත්‍රීය නර්තනාංගයක ප්‍රතීයමාන නොවෙ යි.

පහතරට නර්තනය හා සම්බන්ධව විෂය කරුණු විෂය නිර්දේශ සඳහා අන්තර්ගත කිරීමේ ගෞරවය විල්සන් ඔලබොඩුව, එස්.එල්.එච්. ප්‍රනාන්දු සහ කේ..එස්. ප්‍රනාන්දු යන ගුරුභවතුන්ට හිමිවිය යුතුය. ඔවුන්ගේ සාමූහික ප්‍රයත්නයක් ලෙස නර්තන විෂය නිර්දේශයන්ට අන්තර්ගත කළ පහතරට නමස්කාරය හා ඉලංගම් සරඹ ආදී සරඹයන් මගින් පහතරට නර්තනය සඳහා අවශ්‍යය පදනම සකස් විය.[34]

**සීමා සහ දුබලතා**

පාසැල් අධ්‍යාපන පද්ධතියෙ හි සෞන්දර්ය අධ්‍යාපනය විෂයක් වශයෙන් නර්තන විෂය ආරම්භවන හය ශ්‍රේණිය නව නර්තන විෂය නිර්දේශය 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක වෙයි.එම විෂය නිර්දේශය සැකසීමේ දී සංස්කාරක මණ්ඩලය අපේක්ෂා කරණු ලබන ඉගෙනුම් ඵල ලෙස දැක්වෙන[35]

1. සංස්කෘතික උරුමයක් ලෙස ගොඩනැගුණු නර්තන කලාවේ ගෞරවය හා ගුරු සිසු සබඳතාවෙහි සදාචාරත්මක අගය ආරක්ෂා කිරීම.

2. නර්තනය ආරම්භ කිරීමට පෙර යහපත් මානසිකත්වයෙන් යුතු ප්‍රවිශ්ටයක් ලබාගැනීම.

3. සිරුරේ කොටස් නිවරදි ඉරියව් වලින් යුක්තව පිහිටුවා ගැනීමට අවකාශය සැලසීම.

4. නර්තනය සඳහා ආගමික වශයෙන් ආශීර්වාද ලබා ගැනීම වැදගත් බව අවබෝධකර ගැනීම.

වැනි අභිමතාර්ථ අතරින් පළමු කරුණ හැරුනු කොට අපේක්ෂා කරනු ලබන සෙසු අභිමතාර්ථයන් දෝ.න.හ මගින් සඵල වනවා ද? යන්න ගැටලුවකි. නමුත් ව්‍යවස්ථාපිතව ජාතික අධ්‍යාපන ආයතනය වැනි ආයතනයන් මගින් සම්පාදනය කරන ලද විෂය නිර්දේශයන් විචාරය ට ලක් කිරීම පිළිබඳව වන ගැටලුව ත් දෝ.න.හ පාසැල් සහ අනෙකුත් අධ්‍යාපන ආයතනයන් හි දීර්ඝ කාලීන ව ගුරු සිසු ප්‍රජාව තුළ දෝෂ සහිතව විකාශනය වීමත් මෙම පර්යේෂණයෙ හි සීමා සහ දුබලතා ලෙස දැක්විය හැකිය.

---

[34] කෝට්ටේගොඩ ජයසේන, ප්‍රායෝගික පහතරට නර්තනය, ජේ. කේ. පබ්ලිකේෂන්, සීමාසහිත ඕවල් ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්, 1996, ප්‍රථම මුද්‍රණය, 9 පිටුව

[35] නර්තනය, අතිරේක කියවීම් පොත, 6 ශ්‍රේණිය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම, ශ්‍රී ලංකාව, මුද්‍රණාලය ජාතික අධ්‍යාපන ආයතනය, 2016, ප්‍රථම මුද්‍රණය, 17/18 පිටු

මෙවැනි දෝෂ සහිත විෂය කරුණු නිවරදි කිරීම සහ නව විෂය නිර්දේශ මගින් විෂය කරුණු යාවත්කාලීන කිරීමේ වගකීම එකී සංස්කරණ කාර්‍යයයන් සඳහා සම්බන්ධවන සම්පත් දායකයින් සතුය.

**පර්යේෂණ ප්‍රතිඵල**

පහතරට නර්තනයෙහි භාවිත නමස්කාර හරඹය ගැටලු සහිත අධ්‍යයන කොටසක් බව ඉහත විෂය කරුණු ඉදිරිපත් කිරීමේදී පැහැදිලි විය. නමස්කාර හරඹයක අන්තර්ගත විය යුතු මූලික සිද්ධාන්තවන සරල බව, සෑම ශෛලියකට ම පොදු වීම, වැඳීමේ අංග චලනයන්ගෙන් යුක්ත වීම, අදාළ ශෛලින් හි සුලභව දකීම ට හැකිවීම, මූලික බෙර පද ඇසුරින් නිර්මාණය වී තිබීම සහ ලය මානයකන් මත පිහිටා පිරිසිදු අංග චලනයන්ගෙන් යුක්තව නර්තනය කිරීමට හැකිවීම ආදී සිද්ධාන්ත මත පිහිටා රයිගම් කෝරළයෙ හි භාවිත නමස්කාර හරඹය විධිමත් අධ්‍යාපන ක්‍රම වේදයන්ට යෝග්‍ය නමස්කාර හරඹය ලෙස ඉදිරිපත් කරනුයේ විවිධ ශෛලීන්ගේ බෙරපද උච්චාරණය සහ වාදන ක්‍රම විවිධ වුව ද, නමස්කාර හරඹය නර්තනයේ දී එකී ශෛලීන්හි පොදු වූ සරල ක්‍රමයක් අනුගමනය කරනු ලබන බැවිනි. පහතරට නර්තනයේ දී විවිධ ශෛලීන්හි භාවිත නමස්කාරයන් නිරීක්ෂණය සහ ඒවායේ සමාන අසමානතා සහ නමස්කාරයක අන්තර්ගත වියයුතු උක්ත මූලිකාංග විශ්ලේෂණය මගින් පහතරට නර්තන අධ්‍යාපන ක්‍රමයට උචිත නමස්කාරය ලෙස රයිගම් කෝරළයෙහි භාවිත නමස්කාර හරඹය බව මෙම පරීක්ෂණයෙන් තහවුරු විය. මන්දයත් එකී ශෛලියේ නමස්කාරයෙ හි අන්තර්ගත පිරිසිදු අංගචලන භාවිතය සහ එකී හරඹය සඳහා භාවිත බෙර පදය මූලික බෙර අක්ෂර ඇසුරෙන් නිර්මාණය වීම වැනි නමස්කාරයක අන්තර්ගත වියයුතු මූලිකාංග පූර්ණයවන බැවිනි. එය මෙම පර්යේෂණයේ ඉගෙනුම් ඵලය ලෙස සඳහන් කිරීම වටී. එමනිසා නර්තන විෂය ඉගැන්වෙන පාසැල්, විශ්වවිද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපන ආයතනයන්හි ඉගැන්වීමේ කාර්ය සඳහා නර්තන විෂය නිර්දේෂයන්ට යෝ.න.හ හඳුන්වා දී එය නිවැරදිව යාවත්කාලීන විය යුතු බවට සාධාරණ මතවාදයක් ඉදිරිපත්කිරීම මෙම විස්තෘත පත්‍රිකාවේ පර්යේෂණ ප්‍රතිඵලය ලෙස දක්වමි.

පුද්ගල ස්මෘතියට වඩා අනුභූතීන් ඇසුරින් ලත් ස්මෘතීන් වැදගත්ය. දෝ.ස.න.හ පවතින නර්තන අධ්‍යාපන ක්‍රමයට අනුගත නොවන බව මෙකී පර්යේෂණයෙන් තහවුරු විය. එබැවින් සාර්ථක ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස යෝ.න.හ භාවිත කළහැකි බව දක්වනුයේ සංකීර්ණ වූ ඉගෙනුම් ක්‍රමයන්ට වඩා සරල ඉගෙනුම් ක්‍රම මඟින් සංජානනය වන දැනුම ඉක්මණින් අවධාරණය, අවබෝධය සහ අවශෝෂණයවන බැවිනි.

ඉහත දැක්වූ කරුණු මත පදනම්ව ශිෂ්‍ය සහ ගුරු දෙපාර්ශවයෙහි සුභ සිද්ධිය උදෙසා භාවිත කළහැකි නර්තන අභ්‍යාසයක් ලෙස යෝ.න.හ දක්වමි. නර්තන ශිල්පියා කේන්ද්‍ර ගතව නර්තනය මාධ්‍ය කොට ඔවුන් වටා වූ පරිසරය ආශ්‍රිත සංකේතයන්ට (බුදුන්, දෙවියන් හා සමගාමී නර්තන හා වාදන ශිල්පීන් ප්‍රේක්ෂකයන් හා බැතිමතුන්ට) පොදු ආමන්ත්‍රණයකින් යුතුව මෙකී සියලු දෙනාගේ නේත්‍ර දෘෂ්ටියට හසුවන ආකාරයට නමස්කාර නර්තනය කිරීමට පහතරට නර්තන ශිල්පියාගේ විඥ්ඥාණය ප්‍රවුල වී ඇත. චර්යාවාදී න්‍යායන්ට අනුව ක්‍රියාකාරී ආරෝපණය (Operative conditioning) සහ සමාජ ඉගෙනුම් න්‍යායට අනුව පුද්ගල අවබෝධය සහ සමාජ අත්දැකීම් ඔස්සේ ධනාත්මක උපස්ථම්භයකින් යුක්තව (Reinforcement) පහතරට සාම්ප්‍රදායික නර්තන නමස්කාර හරඹය ගොඩනැගී ඇතත් එකී අභ්‍යාසය පිළිබඳව අවිඥ්ඥාණිකව නර්තන විෂය

නිර්දේශයන්ට අන්තර්ගත කිරීමේදී ඇතිවන ගැටලු සඳහා පිළියමක් වශයෙන් ප්‍රජානන න්‍යායානුකූලව(cognitive theory) මානවබුද්ධිය, සිතීම, අවධානය, සංජානනය යන ප්‍රජානන මූලධර්ම මත පිහිටා අධ්‍යතනයෙහි භාවිත දෝ.ස.න. හරඹයට වෙනුවට යෝ.න.හ ඉදිරිපත් කරමි. 1962 වර්ෂයේ දී පහතරට නර්තන විෂය විෂයක් වශයෙන් විධිමත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද යටතේ ආරම්භව වසර හැටක් පමණ ගතවුව ද නර්තන විෂය සමගාමී අධ්‍යාපන ආයතන මගින් පැවැත් වූ නර්තන ගුරු සංස්කරණ සම්මේලනයන්හි සම්පත් දායකයින් සෙසු පුද්ගල අදහස් සඳහා නම්‍යශීලී නොවීම, සෙසු පුද්ගල අදහස් සඳහා ගරු නොකිරීම වැනි මූලධර්මවාදී අදහස් නිසාවෙන් හෝ උක්ත විෂය කරුණ පිළිබඳව ඔවුන් තුළ වූ අනවබෝධය හෝ උක්ත විෂය කරුණ පිළිබඳව අවධානයක් නොදැක්වීම වැනි හේතු නිසාවෙන් අද්‍යතනය දක්වා මෙම විෂය ගැටලුව පවතියි. පහතරට නර්තනය හා බැඳි මෙම විෂය ගැටලුව නිරාකරණය උදෙසා අනුභූතාත්මකව සහ යථානුභූතීව සංජානිත කරුණු පර්යේෂණ මූලධර්ම මත පිහිටා ඥාණමීමංසාත්මකව මෙම විස්තෘත පත්‍රිකාව මගින් ප්‍රාමාණික අධ්‍යයනයක් වූ බැව් විශ්වාස කරමි.එමෙන්ම මෙම පර්යේෂණයෙන් අධ්‍යනිත විෂය ගැටලුව නිරාකරණය වුවහොත් එය පහතරට නර්තන විෂය ක්ෂේත්‍රයේ ඥාන, ඵලදායීතාවය සඳහා ඉවහල්වන බව අවධාරණය කරමි. එමගින් උක්ත විෂය අධ්‍යයනය සඳහා විෂය බැහැර කිරීම වෙනුවට විෂය තෝරා ගැනීමට ශිෂ්‍ය ප්‍රජාව පෙලඹෙයි. නමස්කාරය නම් වූ ප්‍රාරම්භක අභ්‍යාසය ක්‍රමානුකූලව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුකිරීමෙන් ශිෂ්‍ය ප්‍රජාව තුළ පහතරට නර්තන විෂය පිළිබඳව ගුණාත්මක ආකල්පයක් ගොඩනැගෙනුයේ එයින් සමස්ත විෂය අන්තර්ගතය පිළිබඳව යහපත් ප්‍රතිරූපයක් ආධුනිකයා ට සංජානනය වන බැවිනි. පාසැල් ප්‍රජාවගේ යහපත් දෘෂ්ටිවාදය උක්ත විෂයෙ හි පැවැත්ම කෙරෙහි ද බලපානු ඇත.

ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය


1. අධ්‍යාපනයේ මනෝ විද්‍යාත්මක පදනම, අබේපාල රෝලන්ඩ්, සාර ප්‍රකාශන, තරංජි ප්‍රින්ටර්ස්, නාවින්න, 2010, ප්‍රථම මුද්‍රණය

2. උඩරට නැටුම් කලාව, සේදරමන් ජේ. ඊ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1979, 3 වනමුද්‍රණය

3. නන්දි කේෂ්වරයන්ගේ අභිනය දර්පණය, පතිරණ සේනාරත්න, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 1991, ප්‍රථම මුද්‍රණය

4. නර්තනය, අතිරේක කියවීම් පොත, 6 ශ්‍රේණිය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම, ශ්‍රී ලංකාව, මුද්‍රණාලය ජාතික අධ්‍යාපන ආයතනය, 2016, ප්‍රථම මුද්‍රණය

5. නර්තනය, අතිරේක කියවීම් පොත, 13 ශ්‍රේණිය, සෞන්දර්ය දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම, ශ්‍රී ලංකාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2014, ප්‍රථම මුද්‍රණය

6. නර්තන ගවේෂී, මුද්‍රා යෙදුම පිළිබඳ අර්ථකතනයක්, ඩබ්. එච්. ගුණතිලක, සංසකරණයඃ මහාචාර්ය ලයනල් බෙන්තරගේ, සේනාරත්නපතිරණ, 2016

7. අජන්තා ආරියවතී, නර්තන විකාශනය, තරංජි ප්‍රින්ටස්, මහරගම

8. නිහාල් බර්ට්‍රම්, නිදහස් අදහස් නිදහස් ද?, ශාස්ත්‍ර බර්ට් පබ්ලිකේෂන්, ලක්මාලි මුද්‍රණාලය, නුගේගොඩ, 2014, ප්‍රථම මුද්‍රණය

9. නෘත්‍ය චින්තාමනී, සේදරමන්, ජේ. ඊ, සී.ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, 1947, ප්‍රථම මුද්‍රණය

10. පර්යේෂණ නිබන්ධන අත්පොත, පරමානන්ද හිමි, පොල්ගස්වත්තේ, සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2016, දෙවන මුද්‍රණය
11. ප්‍රායෝගික පහතරට නර්තනය, කෝට්ටේගොඩ ජයසේන, ජේ. කේ. පබ්ලිකේෂන්, සීමාසහිත ඕවල් ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්, 1996, ප්‍රථම මුද්‍රණය
12.ලක්දිව පැරණි නර්තන කලාව, කැකුලන්ද කෝෂලී, සමන්ති පොත් ප්‍රකාශකයෝ, එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්, කොළඹ 10, 2014, ප්‍රථම මුද්‍රණය
13. ශ්‍රී ලාංකික නර්තනයේ විකාශනය(1908-1978), කාරියවසම් තිස්ස, සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2013
14. සංඛ, ජූලි - දෙසැම්බර් ශාස්ත්‍රීය ලිපි සරණිය, නර්තන කලාවේ දාර්ශනික මුහුණුවර, කේ. බී. ඩී. එඩ්මන්ඩ්, සංස්කෘතිකකටයුතු දෙපාර්තමේන්තුව, 2004
15. සබරගමු නර්තන කලාව, රාජපක්ෂ ශ්‍රියාණි, සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2014, තෙවන මුද්‍රණය
16. ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය, සෞන්දර්ය දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මහරගම, ශ්‍රී ලංකාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2014, ප්‍රථම මුද්‍රණය